**ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය**
**මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය**
**නීති අධ්‍යනාංශය**
**නීතිවේදී උපාධි පාඨමාලාව -6 වන මට්ටම**
**අඛණ්ඩ ඇගයීම් පරීක්ෂණය 2 -2021/22**
**LLU6716 -වාණිජ නීතිය**
**කාලය පැය එකයි**

---

**දිනය- 2022 සැප්තැම්බර් 16** **වේලාව- පස්වරු 1.30 -2.30**

---

**එක් ප්‍රශ්නයකට පමණක් පිළිතුරු සපයන්න.**

**අපැහැදිලි අත් අකුරු සඳහා ලකුණු අඩු කරනු ලැබේ.**

1. බණ්ඩාරවෙල ප්‍රදේශයේ සිටින රෝස මල් සැපයුම්කාරිනියක වූ මාලිනී, 2022 සැප්තැම්බර් 10 වන දින කොළඹදී සිය මංගල උත්සවය පැවැත්වීමට නියමිත මුහීකා වෙත රතු රෝස මල් 200 ක් යැවීමට එකඟ විය. මුහීකා මාලිනී වෙත දන්වා සිටියේ ඇයට එම රතු රෝස මල් 200 සැප්තැම්බර් 9 වන දින හවස අවශ්‍ය වන බවත් එවිට අවශ්‍ය අලංකරණ කටයුතු කිරීම සඳහා මංගල උත්සව සැලසුම්කරු වෙත එම මල් ලබා දීමට ඇයට හැකි වන බවත්ය. මාලිනී සැප්තැම්බර් 8 වන දින 'එක්ස්ප්‍රස්' භාණ්ඩ ප්‍රවාහන සේවාව වෙත අදාළ මල් තොගය භාර දෙමින් ' සැප්තැම්බර් 9 වන දින පස්වරු 5.00 පෙර මෙම මල් තොගය දෙනු ලැබූ ලිපිනයට භාර දෙන්න' යනුවෙන් උපදෙස් ලබා දුන්නාය.
   ඉන්ධන හිඟය හේතුවෙන් 'එක්ස්ප්‍රස්' භාණ්ඩ ප්‍රවාහන සේවාවට 2022 සැප්තැම්බර් 9 වන දිනට මල් තොගය ප්‍රවාහනය කිරීමට නොහැකි විය. කෙසේවෙතත් 2022 සැප්තැම්බර් 10 වන දින පෙරවරු 8.00 වන විට එය භාර දෙන ලදී. පාර්සලය විවෘත කර බලන විටදී අනාවරණය වූයේ රෝස මල් 150 ක් පමණක් එවා ඇති බවත් ඒ අතරින්ද භාගයක් පමණ මල් සංඛ්‍යාවක් හානියට පත් වී ඇති බවත්ය.

   1896 අංක 11 දරන ශ්‍රී ලංකාවේ භාණ්ඩ විකිණීමේ ආඥා පනතේ ප්‍රතිපාදන ඇසුරින් ඉහත සිද්ධිය තුළින් උද්ගත වන නෛතික ප්‍රතිඵල සාකච්ඡා කරන්න. මුහීකා හට යම් ප්‍රතිකර්මයක් පවතීද යන්න පැහැදිලි කරමින් ඔබගේ පිළිතුර නඩු තීන්දු ඇසුරින් තහවුරු කරන්න.

   **(ලකුණු 20)**

2. අත්පිට මුදලට පමණක් මෝටර් බයිසිකල් අලෙවි කරන ව්‍යාපාරයක හිමිකරුවෙකු වූ ඩේවිඩ්, තමාට කුලී සින්නක්කර ගිවිසුම් යටතේ මෝටර් බයිසිකල් විකිණීමද ඇතුළත් කරමින් ව්‍යාපාරය පුළුල් කළ හැකිද යන්න සලකා බලමින් සිටී. ඔහු පහත කරුණු සම්බන්ධයෙන් ඔබගේ උපදෙස් පතයි.

   (I) භාණ්ඩ විකිණීමේ ගිවිසුමක් සහ කුලී සින්නක්කර ගිවිසුමක් අතර වෙනස

   **(ලකුණු 08)**

   (II) කුලී සින්නක්කර ගිවිසුමක් යටතේ හිමිකරුවෙකුගේ අයිතිවාසිකම් සහ වගකීම්

   **(ලකුණු 12)**

   1980 අංක 29 දරන ශ්‍රී ලංකාවේ පාරිභෝගික ණය පනතේ ප්‍රතිපාදන ඇසුරින් ඩේවිඩ්ට උපදෙස් දෙන්න. ඔබේ පිළිතුර නඩු තීන්දු ඇසුරින් තහවුරු කරන්න.

*හිමිකම් ඇවිරිණි*